


# සමාජවාදයේ බිල්ලා?



*විශාල ලාභයක් ලබන ආකර හිමියන් ගෙන් බද්දක් අය කිරීමට ගිලාර්ඩ් රජය තීරණය කළේ ඔවුන් තනිව පරිහරණය කරන ධනයෙන් සීමිත කොටසක් පොදු ජන යහපත උදෙසා වැය කරනු පිණිස ය.*

පසුගිය දා අය වැය පිළිතුරු කතාව කළ විපක්ෂ නායක ටෝනි ඇබට් ඒ නිසා පැහැදිලි ජනතා ප්‍රසාදයක් ලබා ගත් බව කියැවෙයි. ඔහුගේ කතාවේ එන වචන කුට්ටම් දෙකක් මගේ හිතට තදින් කාවැදී ඇත. සමාජවාදය සහ පන්ති සටන යන දෙක.

ගිලාර්ඩ් රජය සමාජවාදී මුහුණක් පෙන්වනවා යයි ඔහු කීවේ ප්‍රශංසා මුණයෙන් නොවේ. සමාජවාදය මේ රට ජනතාවට අරුචි යෙදුමක් හා සංකල්පයක් බව දැනගෙනය. සමාජවාදය එපා නම් පන්ති සටනට ඒ තරම් වත් කැමැත්තක් තිබිය නොහැකි ය.

තිස් ගණන් වල බ්‍රිතාන්‍යයෙන් පන්ති සටන ලංකාවට ගෙනාවේ උසස් අධ්‍යාපනය හමාර කොට පෙරලා සිය රට බලා එන එන් එම් පෙරේරා, එස් ඒ වික්‍රමසිංහ, පිලිප් ගුණවර්ධන වැනි උග්‍ර විප්ලවවාදියෝ ය. සමසමාජ නායක එන් එම් පෙරේරා විපක්ෂ නායක තැනට එන්නට තරම් වාමාංශික පක්ෂ දේශපාලන බලයක් හිමිකර ගත් අවදියක් විය.

නාමමාත්‍ර පාර්ලිමේන්තු නියෝජනයකින් සෑහීමට පත් වන තැනට මුල් සමාජවාදී පක්ෂ වන ලංසසප හා කොමියුනිස්ට් පක්ෂයත් දායාරු වී යද්දී ඔවුන්ගේ තැන අල්ලා ගත් ජවිපෙරමුණ භේද භින්න වෙමින් වුවද අද පවා විප්ලවය ගැන කතා කරන්නේ ය. සැබෑ කොමියුනිස්ට් වාදීන් වශයෙන් පෙනී සිටින්නේ ය.

කොමියුනිස්ට් වාදයට යම්තම් තැනක් ඇති රටක සමාජවාදය යන්න බියක් අරුචියක් දනවන්නේ නැත. එක අතකින් සමාජවාදය විප්ලවය රහිතව ලබා ගන්නා සාධාරණ සමාජ ක්‍රමයක් ලෙසින් ගත හැකි ය. සමාජවාදය කොතරම් නම්බුකාර වචනයක් ද යත් අධිරාජ්‍යවාදීන් ගේ හුරතලා වශයෙන් නමක් දිනා සිටි ජේ ආර් ජයවර්ධන උතුමාණන් වහන්සේ 1978 දී සම්මත කර ගත් ජන රජ ව්‍යවස්ථාවට පවා එය ඇතුළත් කරන්නට තීරණය කළේ ය. අද ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයක් වශයෙන් හඳුන්වන්නේ ඒ අනුව ය.

සමාජවාදය ගරු කරන්නකු නොවූවත් එම ව්‍යාපාරය ඔස්සේ ජනතා ප්‍රසාදයක් ලබා ගත හැකි බව තේරුම් ගන්නට තරම් කපටි නුවණක් ජේ ආර් ට තිබුණේ ය. එහෙයින් අධිරාජ්‍යවාදී හුරතලා සමාජවාදී ජනරජයක් නිර්මාණය කිරීම පුදුමයට කරුණක් නොවේ. පුදුමය ඇමරිකාවේ සමීපතම මිතුරු රටක් වන ඕස්ට්‍රේලියාවට සමාජවාදය අරුචි වීම ය.

එයට හේතුව කුමක් ද?

දුරාවතේ කොමියුනිස්ට් මතධාරීන් සිටිය හැකි වුවත් ඕස්ට්‍රේලියාවේ කිසි දිනක කොමියුනිස්ට් පක්ෂයක් නොවී ය. ඒ විරෝධය නිසා ම දෝ සමාජවාදය යන වචනය පවා ජනතාව බිය වද්දන්නට දේශපාලකයන් වරින් වර ඉදිරියට ගෙන එන සැටි පෙනෙයි. ටෝනි ඇබට් කළේත් ඒකම ය.

දේශපාලන චින්තනය අතින් මේ රට පසුබා සිටින්නේද යන ප්‍රශ්නය නගන්නට සිදුවන්නේ මෙහිදී ය.  බැලූ බැල්මට පෙනෙන කරුණක් වනුයේ ශ්‍රී ලංකාවේ තරමට මෙහි ජනතාව අතර දේශපාලන හැඟීමක් හෝ වාද විවාද හෝ නැති බව ය. පරිසරය බඳු විවිධ විෂය පිළිබඳ උද්ඝෝෂණ හා විරෝධතා ව්‍යාපාර දක්නට ඇතත් දේශපාලනය හුදෙක් මැතිවරණයකදී ඡන්දය දීමට පමණක් සීමා වන සැටියක් එක් අතකින් පෙනී යයි. පක්ෂ දේශපාලනයෙහි උනන්දු වන පිරිස සීමිත බව පෙනෙයි.

දේශපාලන පක්ෂ හා තරග කෙසේ වුව ද සමාජ සාධාරණය පිලිබඳ හැඟීම හා උනන්දුව බොහෝ ඕස්ට්‍රේලියානුවන් වෙතින් පළවන ලක්ෂණයකි. වසර කිහිපයකට පෙර ලන්ඩන් හයිඩ් උද්‍යානයේ පැවැත්වුණ මහා ජාත්‍යන්තර සංගීත සන්දර්ශනයක් ලොවට හඬගා දුන් පනිවුඩය බොහෝ දෙනාට මතක ඇත. ඔවුන්ගේ උද්‍යොග පාඨය වූයේ "දුප්පත්කම ඉතිහාසයට එක් කරමු" යන්නයි. දුප්පත්කම වර්තමානයෙහිද නිරුද්දිතව වැජඹෙන්නේ ය. හරි හමන් වෙනසක් සිදුවූ පාටක් නැත.

මෑතක දී නිව්යෝර්ක්, ලන්ඩන්, සිඩ්නි වැනි ප්‍රධාන නගර වල අල්ලා ගැනීමේ නොහොත් අත්පත් කර ගැනීමේ ව්‍යාපාරය දියත් කරන ලද්දේ වර්තමාන ධනපති ක්‍රමය අසාර්ථකව ඇති නිසා ය. නගර මධ්‍යයේ කූඩාරම් ගසාගෙන සිටි සියලු දෙනාම මේ වන විට විරෝධතාවන් අත්හැර දමා ඇත. වෙනසක් සිදු වූවාට නොවේ. වෙනසක් කිරීමට ඒ වාගේ කෙනෙහිලි කිරීම ප්‍රමාණවත් නොවන බව වටහා ගත් නිසා විය යුතු ය.

එසේ වුව ද ප්‍රශ්නය නොවිසඳී ඇති බව අදත් බලවත් රටවල් බොහෝ ගණනක් මුහුණ පා ඇති ආර්ථික අර්බුදයෙන්ම සනාථ වන්නේ ය. ජාතික ධනයෙන් අති බහුතරය සීමිත පුරවැසි පිරිසක් සතුව පවත්නා තෙක් සමාජ අසාධාරණයත් ආර්ථික අර්බුදයත් පවතිනු ඇත.

විශාල ලාභයක් ලබන ආකර හිමියන් ගෙන් බද්දක් අය කිරීමට ගිලාර්ඩ් රජය තීරණය කළේ ඔවුන් තනිව පරිහරණය කරන ධනයෙන් සීමිත කොටසක් පොදු ජන යහපත උදෙසා වැය කරනු පිණිස ය. ධනවතුන්ට දී ඇති බදු සහන අඩු කරන්නට තීරණය කර ඇත්තේ ඒ අරමුණ ඇතිවම ය. ටෝනි ඇබට් රජයට චෝදනා කරමින් සමාජවාදී ලේබලය සහ පන්ති සටන් චෝදනාව ඉදිරිපත් කරන්නේ මෙබඳු පියවර නිසා ය. කම්කරු පක්ෂය සමාජවාදී පක්ෂයක් නොවේ. එහෙත් ධනපතීන්ට රිදෙ සුළු පියවරක් ගත්තත් ඔවුන් ඒ ගොඩට දමා ජනතාව මුළා කිරීම පහසු බව විපක්ෂ නායකයාගේ ප්‍රහාරයෙන් පෙනී යයි.

එපමණක් නොවේ. ආකර හිමියන්ට පනවන බද්දට එරෙහිව නඩු මගට යාමට පවා මෙරට ව්‍යාපාරිකයෝ එඩිතර වෙති. රජයට චෝදනා කරමින් ජනතාව ඉදිරියේ පෙනී සිටීමට ඔවුන්ට ශක්තියක් හා මාධ්‍ය අනුග්‍රහයක් ද ඇත. ටෝනි ඇබට් බඳු දක්ෂිණාංශික දේශපාලකයන්ගේ පූර්ණ අනුග්‍රහය ලැබෙන්නේ එබඳු ව්‍යාපාරිකයන්ට ය. තමන් බලයට පත් වූ විගස ආකර හිමියන්ට පැනවූ බද්ද අවලංගු කරන බව දැනටමත් ටෝනි ඇබට් ප්‍රකාශ කර ඇත.

ලොව බිය වද්දමින් හොල්මන් කරන අවතාරයක් ඇතැයි කියමින්ය කාල් මාක්ස් තමාගේ "කොමියුනිස්ට් ප්‍රකාශනය" පටන් ගන්නේ. ඒ අවතාර යළිත් ලොව බිය ගන්වන්නට සමත් වන්නේද යන්න අපට කිව නොහැකි ය. එහෙත් මාර්ක්ස් විසින් කරන ලද තවත් ප්‍රකාශයක් අදටත් වැදගත් වන්නේ එහි අර්ථය වෙනස් ආකාරයකින් සමාජයට බලපාන හෙයිනි. ඔහු එදා ආගම මිනිසා ගේ අබින් වශයෙන් හැඳින්වූයේ ආගම් වල වරදක් නිසා නොවේ. මිනිසුන් මුළා කිරීමට ආගම මුවාවක්  - උපායක් - හැටියට යොදා ගන්නා බලවතුන් පීඩකයන් ගැන කීමට ය.

අද ටෝනි ඇබට් කරන්නේ ඒ වාගේම අබින් වර්ගයක් පෙන්වා මිනිසුන් මුළා කිරීමේ ප්‍රයත්නයක්ද යන්න ප්‍රශ්න කළ යුතු ය.

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements

We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)